19 MAR 2021

16 MAR 2021

තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය
இளைஞர் மற்றும் விளையாட்டுத்துறை அமைச்சு
Ministry of Youth and Sports

අංක.09 , පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07. இல. 09, பிலிப் குணவர்த்தன மாவத்தை, கொழும்பு 07. No.09, Philip Gunawardana Mawatha, Colombo 07.

මගේ අංකය / எனது இல / My No: MOYS/YAD/03/12

ඔබේ අංකය / உமது இல / Your No.:

දිනය / திகதி / Date: 2021.03.15

අධ්‍යක්ෂ ජනරාල්
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

<u>යොවුන් ශීල සමාධි වැඩසටහන</u>

රටේ සංවර්ධනය සඳහා යොමු වූ නිර්මාණශීලී හා විනයගරුක තරුණ ප්‍රජාවක් බිහිවනුයේ ඔවුන් කායික හා මානසික වශයෙන් නීරෝගී හා අධ්‍යාත්මික වශයෙන් හික්මුනු පිරිසක් වූ විටය. තරුණ ප්‍රජාව ඒ සඳහා යොමු කිරීමේ පියවරක් වශයෙන් තරුණ හා ක්‍රීඩා අමාත්‍ය ගරු නාමල් රාජපක්ෂ මැතිතුමාගේ අදහසක් අනුව යොවුන් ශීල සමාධි නමින් වැඩසටහනක් තරුණ ප්‍රජාවගේ සහභාගිත්වයෙන් පැවැත්වීමට සැලසුම් කර ඇත. බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ උපදේශකත්වයෙන් තරුණ හා ක්‍රීඩා කටයුතු අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් සහ ජාතික තරුණ සේවා සභාවේ සහයෝගිත්වයෙන් සහ දේශීය හා ජාත්‍යන්තර සංවිධානවල ක්‍රියාකාරී දායකත්වයෙන් හා අනුශාසකත්වයෙන් මෙම වැඩසටහන පැවැත්වෙනු ඇත.

02. එහි පළමු වැනි වැඩසටහන 2021.03.28 දිනට යෙදෙන නවම් පුර පසළොස්වක පොහෝ දින ඓතිහාසික සේරුවාවිල මංගල රාජමහා විහාරස්ථානය කේන්ද්‍ර කරගනිමින් තරුණ තරුණියන් 500කගේ පමණ සහභාගිත්වයෙන් පැවැත්වීමට අදහස් කර ඇත. ඒ අනුව දිවයිනේ සෑම විහාරස්ථානයක ම සෑම පුර පසළොස්වක පොහෝ දිනක ම තරුණ පිරිස් දාන, ශීල, භාවනාවලට අවතීර්ණය කරවීමට අපේක්ෂා කර ඇති අතර දිස්ත්‍රික්කයක එක් විහාරස්ථානයක් කේන්ද්‍ර කර ගනිමින් මාසිකව මෙහි ප්‍රධාන වැඩසටහන පැවැත්වෙනු ඇත.

03. මේ අනුව ග්‍රාමීය මට්ටමින් ඒ ඒ විහාරස්ථානයන්හි තරුණ පිරිස්වල දායකත්වය වැඩි කර ගැනීම සඳහා සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ දායකත්වය හා සම්බන්ධීකරණය ලබාගැනීමට අවශ්‍ය වැඩපිළිවෙලක් සකස් කර දෙන මෙන් කාරුණිකව ඉල්ලමි.

අනුරාධ විජේකෝන්
ලේකම්
තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

පිටපත

01. රංජිත් සඳනායක මහතා, යොවුන් ශීල සමාධි වැඩසටහනෙහි ප්‍රධාන සම්බන්ධීකාරක - කරු. දැ.ගැ.පි.

දුරකථනය / தொலைபேசி / Telephone: 011-2697934
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2688836
ඊ-තැපැල / மின்னஞ்சல் / E-mail: secretary@mos.gov.lk
වෙබ් / இணையத்தளம் / Web: www.mos.gov.lk